රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.

| මගේ අංකය<br>எனது இல<br>My No | 75/10/පොදු (Class I) | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2023.07.17 |
|---|---|---|---|---|---|

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන නිවේදනයයි.

**<u>සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ</u>**

**<u>සමූපකාර සංවර්ධන කොමසාරිස් තනතුර සඳහා සුදුසු නිලධරයෙකු පත් කරලීම.</u>**

වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය යටතේ වන සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආයතන ප්‍රධානී සමූපකාර සංවර්ධන කොමසාරිස් තනතුර ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ තනතුරක් වන අතර එය මේ වන විට පුරප්පාඩුව පවතී.

02. එම තනතුර සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු ස්ථිර පදනමින් පත්කර ගැනීමට අවශ්‍යව ඇති බව වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශ ලේකම්ගේ අංක MT/ADM/05/Common හා 2023.06.27 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

03. ඒ අනුව සමූපකාර සංවර්ධන කොමසාරිස් තනතුර සඳහා අනුයුක්ත වීමට මනාපය පළ කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් වේ නම්, **2023.07.31** දිනට පෙර ඒ සම්බන්ධයෙන් වන ලිඛිත ඉල්ලීමක්, ජීව දත්ත සටහනක් සමඟ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

පී.ඩබ්ලිව්. රාජපක්ෂ
අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට
දුරකථන : 0112-698605 / ෆැක්ස් : 0112 – 683651
විද්‍යුත් ලිපිනය: pubad.dslas@gmail.com

| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2696211-13<br>011-2166000 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2695279 | ඊ-මේල්<br>மின்னஞ்சல்<br>E-mail | info@pubad.gov.lk | වෙබ් අඩවිය<br>இணையத்தளம்<br>Website | www.pubad.gov.lk |
|---|---|---|---|---|---|---|---|